# 7 ශ්‍රේණිය සිංහල -2022

## 05 ඒකකය

# ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 03ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 05. ශ්‍රී ලංකාවේ අහිකුණ්ඪීක ජනතාව



අහිකුණ්ඪීක ජනයා ලෙස හැඳින්වෙන්නේ කණ්ඩායම් වශයෙන් තැන තැන සංචාරය කරන, ස්ථිර වාසස්ථානවල නො වසන ජන කණ්ඩායමකි. අතීතයේ පවා ගමින් ගම ඇවිදිමින් නයි නටවමින් දිවි ගෙවූ අහිකුණ්ඪීක නම් ගෝත්‍රයක් පැවති බවට විවිධ සාක්ෂි හමුවේ. උදා -

- ✓ පන්සිය පනස් ජාතක පොතේ '**චම්පෙය්‍ය ජාතකය**'
- ✓ සද්ධර්මාලංකාරයේ '**අහිකුණ්ඪීක වත්ථු**'

ලංකාවේ උතුරු මැද, සබරගමු හා නැගෙනහිර පළාත්වල බහුලව ම සැරිසරන අහිකුණ්ඪීක ජනයා ඉන්දීය **කුරවර් ගෝත්‍රයට** සමානකම් දක්වන බව පර්යේෂකයන්ගේ අදහස යි.මේ පාඩම සිංහල **විශ්වකෝෂය** ඇසුරෙන් සකස් කර ඇත. විවිධ ජන කණ්ඩායම් පිළිබඳ තොරතුරු දැන ගෙන ලබන අවබෝධයෙන්, වඩා යහපත් සමාජයක් නිර්මාණය කිරීමට හැකි ය.

## අරුත් පැහැදිලි කිරීම

- ✓ මස්කත් - පිහිය
- ✓ රෝලු - වංගෙඩිය
- ✓ තාලෙ - බේසම

- ✓ ඉරමන් - හිරමනය
- ✓ සත් - කුල්ල
- ✓ පස්රායි - ඇඹරුම් ගල
- ✓ කදව - කළය
- ✓ කුණ්ඩ - කෑම පිසින වළඳ
- ✓ පිපෙට්ටි - පේළාව, නයි පෙට්ටිය
- ✓ නා ඉල්ල - නාග ගෘහය
- ✓ කරත්ත අඹරාව - කරත්තයේ වහල
- ✓ ජීවනෝපාය - රැකියාව
- ✓ රැහේ - කණ්ඩායමේ
- ✓ පාරම්පරික - පරම්පරාවෙන් පැවතෙන
- ✓ තෙලුගු - දකුණු ඉන්දියාවේ ආන්ධ්‍ර ප්‍රදේශයේ ප්‍රධාන භාෂාව

**අවබෝධය**

1. අහිකුණ්ඨික ජනයා තාවකාලික පැල්පත්වල වාසය කරන්නේ කුමන හේතුවක් නිසා ද?
2. අහිකුණ්ඨික ජනයාගේ ජීවිතයට සමීප සතුන් නම් කරන්න.
3. පාඩමේ දැක්වෙන ආකාරයට අහිකුණ්ඨික ජනයාගේ ආගමික විශ්වාස ඉස්මතු වී පෙනෙන කාර්යය කුමක් ද?
4. භූරිදත්ත ජාතකය අහිකුණ්ඨික ජනයාට විශේෂ වන්නේ ඇයි?
5. අහිකුණ්ඨික ජනයා සිය ආරවුල් විසඳා ගැනීමට යොදා ගන්නා ක්‍රමය පාඩම ඇසුරෙන් පැහැදිලි කරන්න.

- **අවබෝධය**

1.
   - ✓ එක් තැනක දින කිහිපයකට වඩා නො රැඳෙන අතර, තැන තැන සංචාරය කරමින් නයි නැටවීම වැනි ජීවනෝපාය කටයුතු කරන නිසා.

2.
   - ✓ නයා
   - ✓ බූරුවා ද
   - ✓ බල්ලා

3. හින්දු ආගම ඔවුන් සාමාන්‍යයෙන් අදහන ආගම වුව ද බෞද්ධාගමික විශ්වාසය මත පදනම්ව පෝය දිනවල සතුන් මැරීමෙන් වැළකී ම.

4. අභිකුණ්ඩික ජනයා නාගයාට විශේෂ සැලකිල්ලක් දක්වන අතර බෝධිසත්ත්වයන්ගේ නාග ආත්මයක් ගැන එම ජාතකයේ සඳහන් වන නිසා ඔවුහු එය තම වර්ගයාගේ ආඩම්බරයට හේතුවක් ලෙස සලකති.

5.

- ✓ ආරවුල් තමා අතර ම නිරාකරණය කර ගනිති.
- ✓ පැමිණිල්ලක් ඉදිරිපත් වූ විට ආරච්චි ප්‍රමුඛ කණ්ඩායම් රැස්වීමක්/ අධිකරණ සභාවක් පැවැත්වෙන අතර සභාව සිය සිරිත් විරිත් හා සම්ප්‍රදායන් මත පිහිටා තීන්දුව ලබා දෙයි.
- ✓ එය පිළිගැනීමට අකමැති වූ විට 'කෝරළමාව' නම් විනිසුරු වෙත ඉදිරිපත් කෙරේ.
- ✓ පැමිණිලිකරු වෙනුවෙන් එක් සැළියක් ද විත්තිකරු වෙනුවෙන් තව සැළියක් ද ලෙස එක සමාන සැළි දෙකක සහල් හා වතුර සම සමව දමා එක ප්‍රමාණයට ම දර දැමූ ළිප් දෙකක තබා එක විට ම ගිනි මොළවා, කලින් පැසුණු බත හිමි තැනැත්තා නිවැරදිකරු ලෙස සැලකීමේ ක්‍රමයක් ද තිබේ.

## උක්ත අනුක්ත භේදය

- වාක්‍යයක ප්‍රධාන වන, ක්‍රියාවෙන් කියැවෙන පද උක්ත පද ලෙස හැඳින්වේ. වාක්‍යයක ක්‍රියාවට යටත් වන කර්ම පද අනුක්ත පද ලෙස හැඳින්වේ. උදා:

1 ගුරුවරු ළමයින් යහමග යවති.
- ✓ ක්‍රියා පදය - යවති
- ✓ උක්ත පද - ගුරුවරු
- ✓ අනුක්ත පදය - ළමයින්

2 ඔවුහු සතුන් දඩයම් කරති.
- ✓ ක්‍රියා පදය - කරති
- ✓ උක්ත පද - ඔවුහු
- ✓ අනුක්ත පදය - සතුන්

3 පොලිස් නිළධාරියා සොරුන් අල්ලයි.
- ✓ ක්‍රියා පදය - අල්ලයි
- ✓ උක්ත පද - පොලිස් නිළධාරියා
- ✓ අනුක්ත පදය - සොරුන්

- නාම පද කිහිපයක් උක්ත අනුක්ත භේදය යටතේ පහත වගුවේ දක්වා ඇත.

| උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|
| මම<br>අපි | මා<br>අප |
| තෝ<br>තොපි | තා<br>තොප |
| ඔහු<br>ඔවුහු | ඔහු<br>ඔවුන් |
| කුරුල්ලා | කුරුල්ලා |
| කුරුල්ලෝ<br>ළමයි<br>මිනිස්සු<br>ගුරුවරු | කුරුල්ලන්<br>ළමයින්<br>මිනිසුන්<br>ගුරුවරුන් |
| ළමයෙක්<br>හාවෙක් | ළමයකු<br>හාවකු |
| මනාලියක්<br>සහෝදරියක් | මනාලියක<br>සහෝදරියක |

**ලිඛිත අභ්‍යාස**

1. පහත දැක්වෙන උක්ත පදවල අනුක්ත පදය ලියන්න.

| | | | |
|---|---|---|---|
| අපි | - | දෙවියෙක් | - |
| මම | - | දරුවෙක් | - |
| ඔවුහු | - | දැරියක් | - |
| තොපි | - | කාන්තාවක් | - |
| සමනලයෝ | - | ගුරුවරියක් | - |

**1.**

| | | | |
|---|---|---|---|
| අපි | - අප | දෙවියෙක් | - දෙවියෙකු |
| මම | - මා | දරුවෙක් | - දරුවෙකු |
| ඔවුහු | - ඔවුන් | දැරියක් | - දැරියක |
| තොපි | - තොප | කාන්තාවක් | - කාන්තාවක |
| සමනලයෝ | - සමනලයින් | ගුරුවරියක් | - ගුරුවරියක |

2. උක්ත හා අනුක්ත පද යොදා පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| කුමාරයෝ | ........................... |
| ........................... | ඔවුන් |
| ඕ තොමෝ | ........................... |
| සමනලයෙක් | ........................... |
| වෛද්‍යවරු | ........................... |
| ........................... | දරුවකු |

3. පාඩමේ ඇතුළත් උක්ත නාම පද සහ අනුක්ත නාම පද පහ බැගින් ලියන්න.

**2.**

- කුමාරයෝ - කුමාරයන්
- ඔවුහු - ඔවුන්
- ඕ තොමෝ - ඇය
- සමනලයෙක් - සමනලයකු
- වෛද්‍යවරු - වෛද්‍යවරුන්
- දරුවෙක් - දරුවකු

**3.**

- ✓ උක්ත නාම පද
  ස්ත්‍රීහු, මනාලයා, නායකයා, ඔවුහු, බල්ලා
- ✓ අනුක්ත නාම පද
  ස්ත්‍රීන්, වැඩිහිටියකු, බූරුවකු, බල්ලකු, රිළවුන්

## ප්‍රායෝගික අභ්‍යාස (Home Work)

**ප්‍රායෝගික අභ්‍යාස**

1. අභිකුණ්ඨික ජනයා නාගයා හා රිළවා නැටවීමට යොදා ගන්නා නොයෙක් නොයෙක් ක්‍රීඩා ගැන ඔබ දුටු අවස්ථාවක් ඇසුරින් විස්තර කරන්න.

2. මෙම පාඩම ඇසුරින් "ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනයා" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

- **අහිකුණ්ඨික භාෂාවේ වචන කිහිපයක්**

  - ✓ මස්කත් - පිහිය
  - ✓ රෝලු - වංගෙඩිය
  - ✓ තාලේ - බේසම
  - ✓ ඉරමින් - හිරමණය
  - ✓ සක් - කුල්ල
  - ✓ කදව - වතුර කළය
  - ✓ පී පෙට්ටිය - නයි පෙට්ටිය

- **අහිකුණ්ඨික භාෂාවේ ඥාති නාම කිහිපයක්**

  - ✓ අබ්බඩා - පියා
  - ✓ මාමා - මව
  - ✓ අට්ටම්මා - නැන්දා
  - ✓ පෙඩම්මා - ලොකු අම්මා
  - ✓ අන්නා - අය්යා
  - ✓ තාතා - ආතා
  - ✓ මුල්ලම්මා - ආච්චි

## ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනතාව

ශ්‍රී ලංකාවේ ජීවත් වන විවිධ ජන කොටස් අතුරින් සුවිශේෂ චාරිත්‍ර - වාරිත්‍ර ගති ලක්ෂණ පෙන්නුම් කරන ජන කොටසක් ලෙස අහිකුණ්ඨික ජනතාව හඳුන්වා දිය හැකි ය. ‘අහිකුණ්ඨික’ යන වචනයෙහි අර්ථය සලකා බලන විට ‘අහි’ යන්නෙන ” සර්පයා ද ‘කුණ්ඨික’ යන්නෙන් නැටවීම, ක්‍රීඩා කරවීම යන අර්ථ ලැබෙන බව පෙනී යයි. ඒ අනුව ‘අහිකුණ්ඨික’ යන වචනය ‘නයි නටවන්නා’ යන අර්ථවත් පදයකි.

අහිකුණ්ඨික ජනතාව සංචාරක ජීවිතයක් ගත කරන ජන කොට්ඨාසයකි. ඔව්හු ගමින් ගමට යමින් නාගයින් හා රිළවුන් නටවමින් ද ශාස්ත්‍ර කියමින් ද ජීවිකාව කරති. මොව්හු තාවකාලික වාසස්ථාන තනා ගෙන ජීවත් වෙති. එක් ගමක දින හතකට වඩා රැඳෙන්නේ නැත. සැතපුම් දහයක් පමණ දුරින් තවත් තැනෙක වාසස්ථාන තනා ගෙන තවත් දින හතක් ඒ ප්‍රදේශයේ වාසය කරති. මෙලෙස ඔව්හු රට පුරා සංචාරය කරමින් දිවි ගෙවති. කණ්ඩායම් දෙකක් එක ම ගමක වාසය කරන්නේ ද නැත. වසරකට වතාවක් ලංකාවේ වාසය කරන සියලු ම අහිගුණ්ඨික මිනිස්සු එක තැනකට රැස් වෙති. රැස් වී කණ්ඩායම් අතර ආවාහ විවාහ කටයුතු ද ණය ගනුදෙනු

ආදිය ද සිදු කර ගනිති. ඊ ළඟ අවුරුද්දේ කරන වැඩ කටයුතු හා සංචාරය කරන ප්‍රදේශ පිළිබඳ තීරණය කරන්නේ ද මෙම මහා සම්මේලනයේ දී ය.

එක ගමක දින හතක කාලයකට වඩා වාසය නො කරන්නේ එ ගම අපවිත්‍ර වීම වැළැක්වීමට ය. ගමක වාසය කිරීමට පෙර ඒ ගම් වැසියන්ගෙන් අවසර ගැනීමක් සිදු කරනු ලැබේ. අහිකුණ්ඨික මිනිසුන්ට වාසස්ථාන තනා ගැනීමට බිමක් ලබා දීමට ගම් වැසියෝ අකමැති නො වෙති. ඔවුන්ට ඉඩම් සින්න වීමක් නො වන බව ගම් වැසියන් දන්නා හෙයිනි. බොහෝ විට අහිකුණ්ඨික ජනයා තම වාසය සඳහා කනත්තක් හෝ පාළු බිමක් තෝරා ගනිති. ඊට හේතුව තම වර්ගයාගේ රහස් ආරක්ෂා කිරීමට බව ඔව්හු පවසති.

අහිකුණ්ඨික ජනතා කණ්ඩායම් වශයෙන් ජීවත් වන බව ඉහත සඳහන් විය. මෙම එක් කණ්ඩායමකට පවුල් දෙකත් පහළොවත් අතර ප්‍රමාණයක් අයත් වේ. කණ්ඩායම් නායකයා ආරච්චි හෙවත් 'පෙරිය මනුෂ්‍යයම්' (ප්‍රධාන මිනිහා) නමින් හැඳින් වේ. කණ්ඩායම් නායකයා තෝරා ගනු ලබන්නේ කණ්ඩායමේ සියලු දෙනාගේ ම කැමැත්තෙනි. ඔහු ක්ෂේත්‍රයේ සියලු නීති රීති මනාව දත්, වයස අවුරුදු 30 ඉක්ම වූ අපක්ෂපාතී ව තීරණ ගන්නා පුද්ගලයෙකු විය යුතු ය. නායකයාගේ තීරණයට අවනත වීම කණ්ඩායමේ සියලු දෙනාගේ ම වගකීමකි. කණ්ඩායමේ නායකයා නඩු හබවල දී අධිකරණ තීරකයා ලෙස ද කටයුතු කරයි. කණ්ඩායම් කිහිපයකට ද නායකයෙක් සිටියි. ඔහු 'කෝරල මාමා' නමින් හැඳින්වෙයි.

ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනතාවට දිගු ඉතිහාසයක් ඇත. ඔව්හු ඉන්දියාවේ සිට මෙරටට සංක්‍රමණය වූ ජන කොට්ඨාසයක් ලෙස පිළිගැනේ. ඉතිහාසයේ කුමන වකවානුවක දී ලංකාවට පැමිණියේ දැයි ස්ථිර ව කිව නො හැකි වුවත් ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රය රැසක මොවුන් පිළිබඳ සඳහන් වේ. සද්ධර්ම රත්නාවලියේ 'අහිකුණ්ඨික වත්ථු' නමින් පුවතක් ඇතුළත් වීම, පන්සිය පනස් ජාතක පොතේ 'භූරිදත්ත' හා 'චම්පෙය්‍ය' ජාතක කතාවල නයි නැටවීමෙන් ජීවත් වූ අහිකුණ්ඨිකයකු පිළිබඳ සඳහන් වීම නිදසුන් ලෙස දැක්විය හැකි ය. සොකරි නාට්‍යයෙහි ද ඉන්දියාවේ සිට පැමිණි අහිකුණ්ඨිකයකු පිළිබඳ සඳහන් වේ. මේ කරුණු ඇසුරෙන් පෙනී යන්නේ අහිකුණ්ඨික ජනතාව බොහෝ කලක සිට මෙරට ජීවත් වන බව ය.

අහිකුණ්ඨික ජනයෝ ස්වභාව ධර්මය දේවත්වයෙන් සලකා වැඳුම් පිදුම් කරති. එහෙත් ඇතැම් අහිකුණ්ඨිකයින් පවසන්නේ තමන් බෞද්ධයන් බව යි. එහෙත් ඔවුන් බෞද්ධ වත් පිළිවෙත් අනුගමනය කරන බවක් නොපෙනේ. පන්සල, පල්ලිය, කෝවිල, වෙනසක් නොමැති ව සෑම සිද්ධස්ථානයකට ම වැඳුම් පිදුම් සඳහා යන බව පෙනේ. අහිකුණ්ඨික ජනයෝ හින්දූන් මෙන් සිකුරාදා දිනය ශුද්ධ දිනයක් ලෙස සලකති. එසේ ම විෂ්ණු හා කතරගම වැනි දෙවිවරුන් අදහති. ගව මස් කන මුස්ලිම් ගෙවල්වලට පවා නො යති. එහෙත් බෞද්ධ බෝධිසත්වයන් සහ අහිකුණ්ඨිකයන් අතර සම්බන්ධය ඔව්හු ආඩම්බරයෙන් ප්‍රකාශ කරති.

අහිකුණ්ඨික ජනයෝ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් විශ්වාස කරති. යන්ත්‍ර මන්ත්‍ර හා ගුරුකම් කිලිදෝෂ මගින් විනාශ වීම හෝ බල රහිත වීම සිදු වන බව ඔව්හු විශ්වාස කරති. ඔව්හු කූඩාරමක් ඉදිකළ විගස ම ඒ වටා මැතිරූ ගල් වළලති. බාගෙට පිළිස්සණු රෙදි පාංකඩ අදිති. මේ මගින් කිලි දෝෂවලින් දුරු වීමට මෙන් ම සර්පයන්, වන සතුන් සහ අවට ගම්වල බල්ලන්ගෙන් ආරක්ෂා වීමට හැකි බව විශ්වාස කරති.

නාගයා අහිකුණ්ඨිකයන්ගේ සංකේතය යි. ඔවුන් ජීවත් වන ගෙපැල හඳුන්වන්නේ නා ඉල්ල (නාග ගෘහය) ලෙස යි. අහිකුණ්ඨිකයෝ තමන් සහ නාගයා අතර ඇති සම්බන්ධය ඉතා ගෞරවයෙන් සලකති. අහිකුණ්ඨික පිරිමි නයි නටවති. ගැහැනු ශාස්ත්‍ර කියති. පිරිමි නයි නටවන්නේ නළා පිඹිමිනි. නයි නැටවීමට අමතර ව රිළවුන් නැටවීම ද කරති. නයි නැටවීමෙන් ත්‍රාසයත්, රිළා නැටවීමෙන් විනෝදයත් ගෙන දෙයි. රිළා රඟපෑම් අතර සිංහල රජකාලේ අපරාධකාරයෙකු උලේ ඉන්දවා සිටින සැටි, හොරා පොල් කඩන හැටි, තොටුපළේ දී කෙල්ලට යකා වැහුණු හැටි, තෑගි අරන් නැන්ද මාමා බලන්න යන හැටි ආදි සෙල්ලම් ජනතාවට විනෝදය ගෙන දීමට සමත් වේ.අහිකුණ්ඨිකයෝ නයි ඇල්ලීමට ද, නයි දෂ්ට කළ විට බෙහෙත් කිරීමට ද දක්ෂ වෙති. ඔවුන ් අත නයි ගල් ඇත. නයි ගල් මගින් සර්ප විෂ ඇද්දීම කළ හැකි බවට විශ්වාස කරති.

වර්තමානයේ අහිකුණ්ඨික ජනතාව වෙනුවෙන් වෙන ම ගම්මානයක් ඉදි කර ඇත. ඒ අනුරාධපුර ප්‍රදේශයේ 'කුඩාගම' නම් ප්‍රදේශය යි. එහෙත් සංචාරක අහිකුණ්ඨිකයෝ තවමත් දුලබ නො වෙති.



නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය - 2020

## සිංහල භාෂාව

## 7 ශ්‍රේණිය

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**(5) ඒකකය**

### ශ්‍රී ලංකාවේ අභිගුණ්ඨීක ජනතාව

- **පෙළ පොතේ නියමිත පාඩම ඇසුරෙන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01.(i) අභිගුණ්ඨිත ජනතාව ගැන දැන ගැනීමට ඇති සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

……………………………………………………………………………………..

(ii) මොවුන් ජීවනෝපාය සඳහා කරන ලද රැකියා මොනවාද ?

……………………………………………………………………………………..

(iii) මෙම ජනතාව වැඩිපුර දැකිය හැක්කේ කවර පළාත් වලදී ද ?

……………………………………………………………………………………..

(iv) අභිගුණ්ඨීක ජනයාගේ ජීවිතයට සමීප සතුන් නම් කරන්න.

……………………………………………………………………………………..

(v) අභිගුණ්ඨීක පුරුෂ පක්ෂය ජීවනෝපාය සඳහා කරන රැකියා මොනවාද ?

……………………………………………………………………………………..

(vi) භූරිදත්ත ජාතකය අභිගුණ්ඨීක ජනයාට විශේෂ වන්නේ ඇයි ?

……………………………………………………………………………………..

(2) පාඩමේ එන පහත සඳහන් පදවලට සමාන පද රවුම තුළින් තෝරා ලියන්න.

(i) ශ්‍රෝතය ……………………….

(ii) උපකරණ ……………………….

(iii) බල්ලා ……………………….

(iv) බූරුවා ……………………….

(v) සුදු ……………………….

(vi) රිදී ……………………….

(vii) ආවරණය ……………………….

(viii) කෙසෙල් ……………………….

(ix) තීරණය ……………………….

(x) කැකෑරෙන ……………………….

තීන්දුව
රජත, සුනඛය
කදලි , මෙවලම්
වංශය, වැසීම
ධවල , උණුවන
කොටළුවා

(3) පහත සඳහන් මුල් තීරුවේ ඇති පද උක්ත අනුක්ත පදද වශයෙන් වෙන්කොට අදාළ තීරුවල ලියන්න.

| උක්ත හා අනුක්ත පද | උක්ත පද | අනුක්ත පද |
|---|---|---|
| ඔවුන් සත්තු<br>දෙවිවරු ළමයකු<br>සහෝදරියක<br>ස්ත්‍රීන් මිනිස්සු<br>නාගයා ක්‍රීඩකයන්<br>ගැහැනිය<br>ගොවියෝ ඇතුන්<br>ළමයි මිනිසෙකු<br>ඇතින්නක්<br>මිතුරෝ කුරුල්ලෙකු<br>දරුවෙක් බල්ලකු<br>මවක් රිළවුන් | | |

(4) පහත සඳහන් වාක්‍යවල අනුක්ත පදය තෝරා ලියන්න.

(i) අභිගුණ්ඨිකයෝ රිළවුන් නටවති. ..............................

(ii) අපි පොත් කියවමු ..............................

(iii) ගැමියා ගවයා බඳියි ..............................

(iv) වෛද්‍යවරු රෝගීන් සුව කරති ..............................

(v) තොපි මා දුටුවෙහු ? ..............................

# ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව



**ලිඛිත අභ්‍යාස**

**01 පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

I ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනයා බ්‍රසීලයේ ඇමර්සන් ගෝත්‍රයට සමානකම් දක්වයි. (    )

II බස්නාහිර පළාත තුළ අභිකුණ්ඨික ජනයා බහුලව ජීවත් වෙයි. (    )

III අභිකුණ්ඨික ජනයා නාගයාට විශේෂ සැලකිල්ලක් දක්වයි. (    )

IV **'කදව'** ලෙස මෙම ජනයා හඳුන්වන්නේ කුල්ල යි. (    )

V ආරවුල් විසඳීම සඳහා මොවුන්ට වෙනම නීති රීති පැවති බව පැහැදිලි වේ. (    )

**02 පහත දී ඇති පොදු ව්‍යවහාරයේ වචනවලට අභිකුණ්ඨික ජනයා භාවිත කරන වචන ලියන්න.**

I පිහිය =

II කුල්ල =

III වංගෙඩිය =

IV බේසම =

V නයි පෙට්ටිය =

යතුර , තාලෙ , සත්

පිපෙට්ටිය , මස්කත් , රෝලු

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

**03 පහත දැක්වෙන උක්ත සහ අනුක්ත පද වශයෙන් වෙන් කරන්න.**

**( මිනිස්සු, ගැමියන්, තෝ, ඔහු, කුමාරයන් ,රිළවු ,මා, ඕතොමෝ, ඇය, ළමයෙක් ,අපි ,ඔවුහු)**

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

**04 හිස්තැනට ගැළපෙන උක්ත පද තෝරා ලියන්න.**

**I ( ළමයි /ළමයින්) ........................ බයිසිකල් පදති.**

II **( මම/ මා) ..................... පාසල් යමි.**

III **( ගායිකාවක/ ගායිකාවක්) ..................... සම්මාන ලැබුවා ය.**

IV **( තොප/ තොපි) ......................පව් නො කරහු.**

V **( ඔවුන්/ ඔවුහු) ...................... පන්තිය තුළ රැඳී සිටිති.**

**05 පහත දැක්වෙන වාක්‍යවල අනුක්ත පදය යටින් ඉරක් අඳින්න.**

**I මම තොප හොඳින් හඳුනමි.**

II **ගුරුතුමා මා ඇමතුවේ ය.**

III **රෝගීහු හෙදියන් කැඳවා ගත්හ.**

IV **ඔහුගේ වාදනය අප පිනවී ය.**

V **ලේඛකයෝ පාඨකයන් දැනුවත් කරති.**

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

**මීගමුව අධ්‍යාපන කලාපය**

**විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය**

**ශ්‍රේණිය : 7**

## 05 වන පාඩම

# ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨක ජනතාව

01. අභිකුණ්ඨක ජනයා යනු කවුරුන්ද?

..........................................................................................................

..........................................................................................................

02. ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨක ජනතාව සැරිසරන ප්‍රදේශ මොවනාද?

..........................................................................................................

..........................................................................................................

03. අභිකුණ්ඨක ජනයා සමානයෙන් වෙසෙන තාවකාලික පැල්පත් තනාගන්නේ කුමකින්ද?

..........................................................................................................

..........................................................................................................

04. අභිකුණ්ඨක ජනතාව තම පැලිපත් වල තබාගන්නා උපකරණ මොනවාද?

..........................................................................................................

..........................................................................................................

05. අභිකුණ්ඨක ජනයා තම ජීවනෝපාය සඳහා සිදුකරන්නේ මොනවාද?

..........................................................................................................

..........................................................................................................

06. අභිකුණ්ඨක ජනයාගේ විශේෂ ලක්ෂණ සේ සලකන්නේ මොනවාද?

.........................................................................................................................

.........................................................................................................................

## උක්ත අනුක්ත භේදය

01. පහත සඳහන් නාම පද වල අනුක්ත පද ලියන්න.

1). මම - .......................................

2). අපි - .......................................

3). ඔබ - .......................................

4). ඔහු - .......................................

5). කුරුල්ලා - .......................................

6). කුරුල්ලෝ - .......................................

7). ළමයි - .......................................

8). වෛද්‍යවරු - .......................................

9). හාවෙක් - .......................................

10). මනාලියෙක් - .......................................


ගුරු ක්‍රිෂාන්ති ප්‍රනාන්දු පැවිදි සොයුරිය

ශා.ජෝෂප් විද්‍යාලය - මීගමුව ශාඛාව

කඩොල් උයන

# පිළිතුරු



**Answer**

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda College,Colombo 10

**නාලන්දා විද්‍යාලය - කොළඹ 10**
**ඒකක පරීක්ෂණය - 2020**
**සිංහල භාෂාව**
**7 ශ්‍රේණිය**

**1.**

I. සද්ධර්ම රත්නාවලියේ 'අහික ණ්ඨික වත්ථු' නමින් පුවතක් ඇතුළත් වීම, පන්සිය පනස් ජාතක පොතේ භූරිදත්ත' හා 'චම්පෙයය' ජාතක කතාවල නයි නැටවීමෙන් ජීවත් වූ අහිකුණ්ඨිකයකු පිළිබඳ සඳහන් වීම නිදසුන් ලෙස දැක්විය හැකි ය. සොකරි නාට්‍යයෙහි ද ඉන්දියාවේ සිට පැමිණි අහිකුණ්ඨිකයකු පිළිබඳ සඳහන් වේ.

II. අහිකුණ්ඨික පුරුෂ පක්ෂය නයි නැටවීම හා රිළවුන් නැටවීම ජීවනෝපාය කර ගනිද්දී අහිකුණ්ඨික ස්ත්‍රීහු අත බලා සාස්තර කීම ජීවනෝපාය කර ගනිති.

III. උතුරු මැද, සබරගමු හා නැගෙනහිර පළාත්වල

IV. නයා, බූරුවා, බල්ලා

V. නයි නැටවීම හා රිළවුන් නැටවීම

VI. අහිකුණ්ඨික ජනයා නාගයාට විශේෂ සැලකිල්ලක් දක්වති. බෝධි සත්ත්වයන්ගේ නාග ආත්මයක් සඳහන් වන 'භූරිදත්ත ජාතකය' ඔවුහු තම වර්ගයාගේ ආඩම්බරයට හේතුවක් ලෙස සලකති.

**2.**

I. ගෝත්‍රය - වංශය
II. උපකරණ - මෙවලම්
III. බල්ලා - සුනඛයා
IV. බූරුවා - කොටළුවා
V. සුදු - ධවල
VI. රිදී - රජත
VII. ආවරණය - වැසීම
VIII. කෙසෙල් - කදලි
IX. තීරණය - තීන්දුව
X. කැකෑරෙන - උණුවන

**3.**

| උක්ත පද | අනුක්ත පද |
|---|---|
| සත්තු<br>දෙවිවරු<br>මිනිස්සු<br>නාගයා<br>ගොවියෝ<br>ගැහැනිය<br>ළමයි<br>ඇතින්නක්<br>මිතුරෝ<br>දරුවෙක්<br>මවක් | ඔවුන්<br>ළමයකු<br>සහෝදරියක<br>ස්ත්‍රීන්<br>නාගයා<br>ක්‍රීඩකයන්<br>ඇතුන්<br>මිනිසෙකු<br>කුරුල්ලෙකු,<br>බල්ලකු<br>රිළවුන් |

**4.**

I. රිළවුන්
II. පොත්
III. ගවයා
IV. රෝගීන්
V. මා



<u>**ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනතාව**</u>



**ලිඛිත අභ්‍යාස**

**01 පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.**

I **ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනයා බ්‍රසීලයේ ඇමර්සන් ගෝත්‍රයට සමානකම් දක්වයි.** (✗)

II **බස්නාහිර පළාත තුළ අහිකුණ්ඨික ජනයා බහුලව ජීවත් වෙයි.** (✗)

III **අහිකුණ්ඨික ජනයා නාගයාට විශේෂ සැලකිල්ලක් දක්වයි.** (✓)

IV **'කදව' ලෙස මෙම ජනයා හඳුන්වන්නේ කුල්ල යි.** (✗)

V **ආරවුල් විසඳීම සඳහා මොවුන්ට වෙනම නීති රීති පැවති බව පැහැදිලි වේ.** (✓)

**02 පහත දී ඇති පොදු ව්‍යවහාරයේ වචනවලට අහිකුණ්ඨික ජනයා භාවිත කරන වචන ලියන්න.**

I **පිහිය** = මස්කත්

II **කුල්ල** = සත්

III **වංගෙඩිය** = රෝලු

IV **බේසම** = තාලෙ

V **නයි පෙට්ටිය** = පිපෙට්ටි (පේළාව)

| | | |
|---|---|---|
| **යතුර** , | **තාලෙ** , | **සත්** |
| **පිපෙට්ටිය** , | **මස්කත්** , | **රෝලු** |

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

## 03 පහත දැක්වෙන උක්ත සහ අනුක්ත පද වශයෙන් වෙන් කරන්න.

**( මිනිස්සු, ගැමියන්, තෝ, ඔහු, කුමාරයන් ,රිළවු ,මා, ඕතොමෝ, ඇය, ළමයෙක් ,අපි ,ඔවුහු)**

| උක්ත පද | අනුක්ත පද |
| --- | --- |
| මිනිස්සු | ගැමියන් |
| තෝ, ඔවුහු | කුමාරයන් |
| ඔහු, ළමයෙක් | මා |
| රිළවු | ඔහු |
| ඕතොමෝ | ඇය |
| ඇය, අපි | |

## 04 හිස්තැනට ගැළපෙන උක්ත පද තෝරා ලියන්න.

I ( ළමයි /ළමයින්) ළමයි............ බයිසිකල් පදති.

II ( මම/ මා) ....මම........ පාසල් යමි.

III ( ගායිකාවක/ ගායිකාවක්) ගායිකාවක් සම්මාන ලැබුවා ය.

IV ( තොප/ තොපි) ....තොපි......පව් නො කරහු.

V ( ඔවුන්/ ඔවුහු) ....ඔවුහු..... පන්තිය තුළ රැඳී සිටිති.

## 05 පහත දැක්වෙන වාක්‍යවල අනුක්ත පදය යටින් ඉරක් අඳින්න.

I මම තොප හොඳින් හඳුනමි.

II ගුරුතුමා මා ඇමතුවේ ය.

III රෝගීහු හෙදියන් කැඳවා ගත්හ.

IV ඔහුගේ වාදනය අප පිනවී ය.

V ලේඛකයෝ පාඨකයන් දැනුවත් කරති.

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- පී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

**මගඹව අධය◌ාපන කලාපය**

**විෂයය : සි◌ංහල භාෂාව හ◌ා සාහිත්‍යය**

**ශ්‍රේණිය : 7**

05 වන පාඩම

# ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨක ජනතාව

01. අහිකුණ්ඨක ජනයා යනු කවුරුන්ද?

**කණ්ඩායම් වශයෙන් තැන තැන සංචාරය කරන, ස්ථිර වාසස්ථානවල නො වසන ජන කණ්ඩායමකි.**

02. ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨක ජනතාව සැරිසරන ප්‍රදේශ මොවනාද?

**උතුරු මැද, සබරගමු හා නැගෙනහිර පළාත්වල බහුලව ම සැරිසරයි.**

03. අහිකුණ්ඨක ජනයා සමානයෙන් වෙසෙන තාවකාලික පැල්පත් තනාගන්නේ කුමකින්ද?

**තල් කොළවලින්**

04. අහිකුණ්ඨක ජනතාව තම පැලිපත් වල තබාගන්නා උපකරණ මොනවාද?

**පිහිය, වංගෙඩිය, බේසම, හිරමනය, කුල්ල, ඇඹරුම් ගල, කළය, කෑම පිසින වළං, නයි පෙට්ටිය නයි නළාව**

05. අහිකුණ්ඨක ජනයා තම ජීවනෝපාය සඳහා සිදුකරන්නේ මොනවාද?

**අහිකුණ්ඨික පුරුෂ පක්ෂය නයි නැටවීම හා රිළවුන් නැටවීම අහිකුණ්ඨික ස්ත්‍රීහු අත බලා සාස්තර කීම**

06. අභිකුණ්ඨක ජනයාගේ විශේෂ ලක්ෂණ සේ සලකන්නේ මොනවාද?

සංචාරක ජීවන රටාව.........................................................................

සරල පැවැත්ම...............................................................................

# උක්ත අනුක්ත භේදය

01. පහත සඳහන් නාම පද වල අනුක්ත පද ලියන්න.

1). මම - ......මා.................................

2). අපි - ......අප...........................

3). ඔබ - ......ඔබ...........................

4). ඔහු - ......ඔහු...........................

5). කුරුල්ලා - ......කුරුල්ලා...............

6). කුරුල්ලෝ - ..කුරුල්ලන්................

7). ළමයි - ..........ළමයින්.............

8). වෛද්‍යවරු - ..වෛද්‍යවරුන්.........

9). හාවෙක් - ........හාවෙකු................

10). මනාලියෙක් - ..මනාලියක................

ගරු ක්රිෂාන්ති ප්රනාන්තු පැවදි ස
ායුරිය ශා.ස ොෂප් වද්යාලය -
මගඹව ශාබාව කස ාල් උයන

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ